# වාර්ෂික කාර්යසාධන වාර්තාව
## வருடாந்த செயல்திறன் அறிக்கை
## Annual Performance Report

# 2025



දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,අනුරාධපුර
District Secretariat, Anuradhapura
மாவட்ட செயலகம், அனுராதபுரம்

# 2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
# අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## වැය ශීර්ෂ අංකය : 274

**අන්තර්ගතය**


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDGs) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

| | | |
|---|---|---|
| **01 පරිච්ඡේදය** | **-ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරංශය** | **3 - 11** |
| 1.1 | හැඳින්වීම | 3-4 |
| 1.2 | ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | 4 |
| 1.3 | ප්‍රධාන කාර්යයන් | 5 |
| 1.4 | සංවිධාන සටහන | 6 |
| 1.5 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අංශ | **7-9** |
| **02 පරිච්ඡේදය** | **-ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | **10 - 21** |
| 2.1 | ප්‍රගතිය හා විශේෂ ළඟාකර ගැනීම් | 10-19 |
| 2.2 | අභියෝග | 19 |
| 2.3 | ඉදිරි ඉලක්ක | 20-21 |
| **03 පරිච්ඡේදය** | **-වසරේ සමස්ථ මූල්‍ය කාර්යසාධනය** | |
| 3.1 | මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය | 22-23 |
| 3.2 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 24 |
| 3.3 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 25-32 |
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සටහන් | 33-34 |
| 3.5 | ආදායම් එකතු කිරීමේ කාර්යය සාධනය | 35 |
| 3.6 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යය සාධනය | 35 |
| 3.7 | මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 36-39 |
| 3.8 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යය සාධනය | 39 |

| | | |
|---|---|---|
| 3.9 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 40-48 |
| **04 පරිච්ඡේදය** | **-කාර්යය සාධන දර්ශක** | **49** |
| **05 පරිච්ඡේදය** | **- තිරසර සංවර්ධන අරමුණු (SDGs) සපුරා ගැනීමේ කාර්යය සාධනය** | **50** |
| 5.1 | හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු | 50 |
| 5.2 | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | 50 |
| **06 පරිච්ඡේදය** | **-මානව සම්පත් පැතිකඩ** | **51-53** |
| 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 51 |
| 6.2 | ආයතනයේ කාර්යය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය | 51 |
| 6.3 | මානව සම්පත් සංවර්ධනය | 52-53 |
| **07 පරිච්ඡේදය** | **- අනුකූලතා වාර්තාව** | **54-60** |

**01 පරිච්ඡේදය**

**ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

1.1 හැඳින්වීම

අනුරාධපුරය ක්‍රි.පූ. 4 වන ශතවර්ෂයේ සිට ක්‍රි.ව. 11 වන ශතවර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ ප්‍රථම හා දිගුකාලීන රාජධානිය ලෙස පැවති නගරයකි. මෙම කාලය තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන ව්‍යුහය, නීතිමය ක්‍රමවේදය, සමාජ සංවිධානය සහ ආර්ථික පද්ධතිය ක්‍රමවත් හා සංවිධානාත්මක ලෙස ගොඩනැගී ඇත. පණ්ඩුකාභය, දුටුගැමුණු, වලගම්බා, මහාසේන සහ ධාතුසේන වැනි රජවරුන්ගේ රාජකාරි ක්‍රියාකාරකම් හරහා ශ්‍රී ලංකාව එක්සත් රාජ්‍යයක් ලෙස ස්ථාපිත වීමට මූලික පදනම සැකසී ඇති අතර, එහි කේන්ද්‍රීය මධ්‍යස්ථානය අනුරාධපුරය වේ.

අනුරාධපුර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ බෞද්ධ ආගමික උරුමයේ ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස විශේෂ වැදගත්කමක් උසුලයි. ක්‍රි.පූ. 3 වන ශතවර්ෂයේදී අරහත් මහින්ද තෙරුන් විසින් බුදු දහම ශ්‍රී ලංකාවට හඳුන්වා දීමෙන් අනතුරුව, අනුරාධපුරය බෞද්ධ ආගමික හා සංස්කෘතික කටයුතු සඳහා මූලික නගරයක් බවට පත්විය.

ශ්‍රී මහා බෝධිය, රුවන්වැලිසෑය, ජේතවනාරාමය, අභයගිරි විහාරය සහ මිහින්තලය වැනි ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් ආගමික ස්ථාන මෙම දිස්ත්‍රික්කය තුළ පිහිටා තිබීම හේතුවෙන්, එය සංස්කෘතික උරුමය රැක ගැනීමේ ප්‍රධාන කේන්ද්‍රස්ථානයක් ලෙස හඳුනාගත හැක.

වියළි කලාපයට අයත් වුවද, පැරණි රජවරුන් විසින් නිර්මාණය කරන ලද සංකීර්ණ වාරි පද්ධතිය හරහා අනුරාධපුර දිස්ත්‍රික්කය කෘෂිකාර්මික ප්‍රදේශයක් බවට පත් වී ඇත. නුවරවැව, බසවක්කුලම, තිසා වැව, නාච්චාදූව වැව, කලා වැව, රාජංගනය, පදවිය සහ යෝධ ඇළ වැනි ජලාශ හා ඇළ මාර්ග ජලය එකතු කිරීම, සංරක්ෂණය කිරීම සහ සමානව බෙදාහැරීම සඳහා උසස් ඉංජිනේරු දැනුම භාවිතා කර ඇති බව පැහැදිලි වේ. මෙම වාරි පද්ධතිය අදටත් ශ්‍රී ලංකාවේ ජල කළමනාකරණය හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා මූලික ආදර්ශයක් ලෙස භාවිත වේ.

භූමි ප්‍රමාණයෙන් විශාල වන අනුරාධපුර දිස්ත්‍රික්කය වනාන්තර, ජල සම්පත් සහ වනජීවී කලාප සංරක්ෂණය කිරීමේදී ජාතික වශයෙන් වැදගත් භූමිකාවක් ඉටු කරයි. එසේම, උතුරු සහ උතුරු මැද ප්‍රදේශ සම්බන්ධ කරන ප්‍රධාන ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙසද අනුරාධපුරය ක්‍රියා කරයි.

අනුරාධපුර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ ප්‍රථම රාජධානිය ලෙස ඉතිහාසගත වූ, බහු ආගමික හා බහු භාෂික ජනතාවක් ජීවත්වන, ඓතිහාසික, සංස්කෘතික හා භූගෝලීය වශයෙන් අතිශය වැදගත් දිස්ත්‍රික්කයකි. මෙය ශ්‍රී ලංකාවේ විශාලතම දිස්ත්‍රික්කය වන අතර, එහි භූමි විශාලත්වය වර්ග කිලෝමීටර් 7,179 කි. එය ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 11% ක් ද, උතුරු මැද පළාතේ මුළු භූමි ප්‍රමාණයෙන් 68.5%ක් ද ආවරණය කරයි.

භූගෝලීය වශයෙන්, අනුරාධපුර දිස්ත්‍රික්කය උතුරින් වව්නියා දිස්ත්‍රික්කයෙන්, දකුණින් මාතලේ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවලින්, බටහිරින් මන්නාරම සහ පුත්තලම දිස්ත්‍රික්ක වලින්, නැගෙනහිරින් ත්‍රිකුණාමලය සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවලින් මායිම් වී, උතුරු මැද පළාත තුළ පිහිටා ඇත.

මෙම දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ පුරාණ වාරි සංස්කෘතිය නිරූපණය කරන ප්‍රදේශයක් වන අතර, නුවරවැව, කලාවැව, පදවිය වැව සහ තිසා වැව ඇතුළු විශාල වැව් 13 ක්, මධ්‍යම පරිමාණ වැව් 87 ක් සහ කුඩා වැව් 2,990 කින් සමන්විත වේ. මෙම අභ්‍යන්තර ජලාශවල මුළු ව්‍යාප්තිය වර්ග කිලෝමීටර් 145 ක් පමණ වන අතර, එම හේතුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කය ''වැව් බැඳි රාජ්‍යය'' ලෙසද හඳුන්වනු ලබයි.

අනුරාධපුර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ ප්‍රධාන වී නිෂ්පාදන දිස්ත්‍රික්කයක් ලෙස සැලකෙන අතර, වාරි පද්ධති මත පදනම්ව මහ සහ යල කන්න දෙකම සාර්ථකව ක්‍රියාත්මක වේ. මෙය ජාතික ආහාර සුරක්ෂිතතාවයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙයි.

වී වගාවට අමතරව, ඉරිඟු, එළවළු, පළතුරු, පොල් සහ අනෙකුත් වගා ක්ෂේත්‍ර සංවර්ධනය වී ඇති අතර, ගොවි ජනතාවගේ ජීවනෝපාය සහ දිස්ත්‍රික් ආර්ථිකය ශක්තිමත් කිරීමේදී මෙම දිස්ත්‍රික්කය ප්‍රමුඛ භූමිකාවක් ඉටු කරයි. දිස්ත්‍රික්කයේ භූමි භාවිතය කෘෂිකාර්මික භාවිතය, වන සංරක්ෂිත ප්‍රදේශ, ජලාශ හා වාරි පද්ධති, ග්‍රාමීය ජනාවාස සහ නාගරික සංවර්ධන කලාප එකට සම්බන්ධ වූ සංකීර්ණ රටාවකින් යුක්ත වේ. වන සම්පත් සහ ජල සම්පත් සංරක්ෂණය 2025 වර්ෂයේ දිස්ත්‍රික් පරිපාලනයේ ප්‍රමුඛ අවධානයක් ගෙන ඇත.

දේශගුණික වශයෙන්, අනුරාධපුර දිස්ත්‍රික්කය වියළි කලාපීය දේශගුණයකට අයත් වන අතර, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 2025 වර්ෂයේ උපරිම උෂ්ණත්වය සෙල්සියස් අංශක 34.2 ක් සහ අවම

උෂ්ණත්වය සෙල්සියස් අංශක 22.8 ක් ලෙස වාර්තා වී ඇත. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් **172.76** ක් පමණ වේ.

පරිපාලනමය වශයෙන්, අනුරාධපුර දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 කින් සමන්විත වන අතර, ග්‍රාම නිලධාරි කොට්ඨාස 694 ක් සහ මුළු ගම් සංඛ්‍යාව 2,584 කි. 2025 වර්ෂයේ ගෘහ ඒකක ගණන 275,084ක් වන අතර, මුළු ජනගහනය 960,080ක් ලෙස වාර්තා වේ.

අනුරාධපුර දිස්ත්‍රික්කය මැතිවරණ කොට්ඨාස 07 කින් සමන්විත වන අතර, පළාත් පාලන ආයතන ලෙස ප්‍රාදේශීය සභා 18 ක් සහ මහ නගර සභා 01 ක් ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික්කයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය ලෙස කෘෂිකර්මාන්තය ප්‍රමුඛස්ථානයක් ගන්නා අතර, වාරි කෘෂිකර්මාන්තය හා සම්බන්ධ සමාජ–ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රදේශීය සංවර්ධනයට වැදගත් දායකත්වයක් ලබා දෙයි.

***(මූලාශ්‍ර: කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව; සංඛ්‍යා ලේඛන අංශය, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)***




## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### 1.2.1 දැක්ම

“උරුමයන් සුරක්ෂිත තිරසර සංවර්ධනයක්, ප්‍රශස්ත රාජ්‍ය සේවාවක් ”

### 1.2.2 මෙහෙවර

“ දිස්ත්‍රික්කයේ උරුමයන් සුරකිමින්, යහපාලන මූලධර්මයන්ට අනුකූලව රාජ්‍ය ප්‍රතිපත්ති හා අනුගතව මානව අවශ්‍යතා හා පාරිසරික සුරක්ෂිතභාවය තහවුරු කරමින් සම්පත් ප්‍රශස්තව කළමනාකරණය කිරීම.

### 1.2.3 අරමුණු

1. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයට අදාළ ව්‍යවස්ථාපිත කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම
2. ඉඩම් කළමනාකරණය
3. යටිතල පහසුකම් සංවර්ධනය
4. සේවා නියුක්තිය හා ව්‍යවසායකත්ව සංවර්ධනය
5. සමාජ සවිබල ගැන්වීම, ආරක්ෂණය හා අධ්‍යාත්මික සංවර්ධනය
6. පරිසර සංරක්ෂණය
7. ආපදා කළමනාකරණය
8. තිරසර කෘෂිකාර්මික ප්‍රවර්ධනය.

**1.**3 ප්‍රධාන කාර්යයන්

| අරමුණු | ප්‍රධාන කාර්යයන් |
|---|---|
| දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයට අදාළ ව්‍යවස්ථාපිත කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම | 1. නව තාක්ෂණය අනුගත කිරීම තුළින් කාර්යක්ෂම රාජ්‍ය යාන්ත්‍රණයක් ඇති කිරීම<br>2. විධිමත් තොරතුරු කළමනාකරණය<br>3. අල්ලස හා දූෂණය පිටු දැකීම |
| ඉඩම් කළමනාකරණය | 1. රජයේ ඉඩම් හඳුනා ගැනීම /ආරක්ෂා කර ගැනීම<br>2. සංවර්ධනය සඳහා ඉඩම් නිදහස් කිරීම<br>3. ඉඩම් නිත්‍යානුකූල කිරීම සඳහා ප්‍රාදේශීය පරිපාලනය හා ආයතන සම්බන්ධීකර |
| යටිතල පහසුකම් සංවර්ධනය | දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය<br>i. සංවර්ධනය කළ යුතු ස්ථාන හඳුනා ගැනීම<br>ii. ප්‍රමුඛතාගතකරණය<br>iii. ව්‍යාපෘති/ ඇස්තමේන්තු සකස් කිරීම<br>iv. ව්‍යාපෘති අනුමත කිරීම<br>v. අධීක්ෂණය, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම |
| සේවා නියුක්තිය හා ව්‍යවසායකත්ව සංවර්ධනය | 1. දිස්ත්‍රික්කයේ ජනතාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම<br>2. දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම<br>3. ග්‍රාමීය කාන්තා හා තරුණ ව්‍යවසායක ප්‍රවර්ධනය<br>4. වෘත්තීය පුහුණුව තුළින් පුහුණු ක්‍රියාශීලී ශ්‍රම බලකායක් බිහි කිරීම<br>5. ව්‍යවසායකත්ව සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සම්පාදනය |
| සමාජ සවිබල ගැන්වීම, ආරක්ෂණය හා ආධ්‍යාත්මික සංවර්ධනය | 1. සංවර්ධන ක්‍රියාවලිය සඳහා කාන්තාවන් / වෙනස් හැකියාවන් හෝ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්/ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සමාන අවස්ථා සැලසීම තුළින් ආර්ථික හා සමාජයීය වශයෙන් සවිබල ගැන්වීම<br>2. ළමා ආරක්ෂාව තහවුරු කිරීම, නිරෝගී බව හා පෝෂණය ප්‍රවර්ධනය සහ පූර්ව ළමාවිය සංවර්ධනය<br>3. සමාජයීය ආධ්‍යාත්මික සමබරතාව ඉහළ නැංවීම |
| පරිසර සංරක්ෂණය | 1. පරිසර දූෂණය වැළැක්වීම හා සංරක්ෂණය පාදක කර ගනිමින් පාරිසරික ව්‍යවසායකත්ව දිරි ගැන්වීම<br>2. පරිසරයට එකතු වන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීම, නැවත පරිභෝජනයට ගැනීම හා ප්‍රතිචක්‍රීකරණය<br>3. හරිත බව ප්‍රවර්ධනය හා එහි ප්‍රතිලාභ ජනතාව වෙත ලැබෙන බව තහවුරු කිරීම |
| ආපදා කළමනාකරණය | 1. ජීවිත හා දේපළ ආපදාවන්ගෙන් ආරක්ෂා කිරීම හා ආර්ථිකමය හානිය අවම කිරීම<br>2. ස්වභාවික ආපදාවන්ට මුහුණ දිය හැකි ශක්තිමත් ප්‍රජාවක් බිහි කිරීම |
| තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය | 1. පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය<br>2. ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම<br>3. අගය එකතු කළ ආහාර නිෂ්පාදනය සඳහා අවස්ථාව සලසා දීම තුළින් ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම<br>4. යෝග්‍ය වගා ක්‍රම හඳුන්වා දීම |

**1.4 සංවිධාන සටහන**


දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංවිධාන ව්‍යුහය
සහකාර දිස්ත්‍රික් ලේකම්
අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)
ගණකාධිකාරී

## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

### 1.5.1. ප්‍රාදේශීය ලේකම් කාර්යාල

පරිපාලනමය වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 කින් සමන්විත දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස ගණන 694 ක් වන අතර මුළු ගම් ගණන 2,584 කි. 2025 වර්ෂයේ ගෘහ ඒකක ගණන 275,084ක් වන අතර, මුළු ජනගහනය 960,080ක් ලෙස වාර්තා වේ.
(මූලාශ්‍රය - සංඛ්‍යා ලේඛන අංශය, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යයභාරය**

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මානව සම්පත්/ භෞතික සම්පත්/ මූල්‍ය සම්පත් ප්‍රශස්ත කළමනාකරණය සහ අධීක්ෂණය
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මානව සම්පත්/ භෞතික සම්පත්/ මූල්‍ය සම්පත් ප්‍රශස්ත කළමනාකරණය සහ අධීක්ෂණය
- දිස්ත්‍රික්/ ප්‍රාදේශීය පාලනයට අදාළ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණය

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (Divisional Secretariat) | | වර්ග ප්‍රමාණය (ව.කි.මි) – Area ( km2 ) | ග්‍රාම නිලධාරී කොට්ඨාස ගණන No of G.N. Division |
|---|---|---|---|
| 1 | පදවිය | 240 | 15 |
| 2 | කැබිතිගොල්ලෑව | 615 | 26 |
| 3 | මැදවච්චිය | 482 | 37 |
| 4 | රඹෑව | 309 | 38 |
| 5 | හොරොව්පොතාන | 845 | 38 |
| 6 | ගලෙන්බිඳුණුවැව | 291 | 41 |
| 7 | කහටගස්දිගිලිය | 352 | 40 |
| 8 | නැගෙනහිර නුවරගම් පළාත | 403 | 29 |
| 9 | මධ්‍යම නුවරගම් පළාත | 91 | 40 |
| 10 | මහවිලච්චිය | 635 | 17 |
| 11 | නොච්චියාගම | 813 | 36 |
| 12 | තලාව | 234 | 39 |
| 13 | තඹුත්තේගම | 117 | 26 |
| 14 | රාජාංගනය | 101 | 21 |
| 15 | ගල්නෑව | 138 | 30 |
| 16 | ඉපලෝගම | 147 | 32 |
| 17 | මිහින්තලේ | 228 | 25 |
| 18 | තිරප්පනේ | 294 | 41 |
| 19 | කැකිරාව | 331 | 53 |
| 20 | පලුගස්වැව | 201 | 16 |
| 21 | පලාගල | 225 | 35 |
| 22 | නාච්චාදූව | 87 | 19 |
| එකතුව | | **7,179** | **694** |

## 1.5.2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ හා ප්‍රධාන කාර්යයන්

**1.** **ආයතන අංශය**

a. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයට අදාළ මානව සම්පත් කළමනාකරණය
b. කාර්යාල කළමනාකරණය

**2.ගිණුම් අංශය**

c. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයට අදාළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය
d. ප්‍රසම්පාදන කළමනාකරණය
e. වත්කම් කළමනාකරණය

**3.සංවර්ධන අශය**

f. ප්‍රාදේශීය පරිපාලන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කිරීමේ සාකච්ඡා / රැස්වීම් සංවිධානය
g. ස්වදේශ කටයුතු චක්‍රලේඛ 25/2019 අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව සිදු කිරීම මගින් අධීක්ෂණය හා කාර්යයන් සඳහා නිශ්චිත ක්‍රමවේද සකස් කිරීම සඳහා සහාය වීම
h. අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ ආයතන මගින් නියම කර ඇති හෝ ප්‍රතිපාදන වෙන් කිරීම් මත ක්‍රියාත්මක වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ගෙවීම් කිරීමට සහාය වීම
i. ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සහාය වීම
j. අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ ගෙවීම් වැඩ සටහන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කටයුතු
k. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙහි හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි රජයේ සංචාරක නිවාඩු නිකේතන වෙන් කිරීම හා අධීක්ෂණ කටයුතු
l. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ විධිවිධාන ප්‍රකාරව තොරතුරු සැපයීම
m. 1980 අංක 31 දරණ ස්වේච්ඡා සමාජ සංවිධාන ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීමේ පනතෙහි විධිවිධාන අනුව දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය නොවන සංවිධාන මගින් ක්‍රියාත්මක වැඩ සටහන් නියාමනය කිරීම හා දිස්ත්‍රික්කය තුළ දේශීය අරමුදලින් ක්‍රියාත්මක කරන රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය හා රාජ්‍ය නොවන සංවිධාන දිස්ත්‍රික් සම්බන්ධීකරණය.

**4.** **ඉඩම් අංශය**

n. ඉඩම් කළමනාකරණයට අදාළ තොරතුරු, ප්‍රාදේශීය පරිපාලනය හා රාජ්‍ය ආයතන අතර හුවමාරුව
o. රජය මගින් ඉඩම් හා ඉඩම් සංවර්ධනය සම්බන්ධව සිදු කරන විවිධ ව්‍යාපෘති/ වැඩසටහන් අධීක්ෂණය හා සම්බන්ධීකරණය (උදා : සීමා නිර්ණය, යාන් ඔය හා පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘති)

5. **සැලසුම් අංශය**

a. දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය
   i. සංවර්ධනය කළ යුතු ස්ථාන හඳුනා ගැනීම
   ii. ප්‍රමුඛතාගතකරණය
   iii. ව්‍යාපෘති / ඇස්තමේන්තු සකස් කිරීම
   iv. ව්‍යාපෘති අනුමත කිරීම
   v. අධීක්ෂණය, මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම සඳහා දිස්ත්‍රික් ලේකම්ට සහාය වීම
b. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පැවැත්වීම.
c. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික සැලැසුම් හා සම්පත් පැතිකඩ සකස් කිරීම
d. ආහාර අවශ්‍යතා ප්‍රමුඛ කරගෙන නිෂ්පාදන පරිමාව වර්ධනය කිරීම, ආහාර සුරක්ෂිතතාව, පෝෂණය හා දිළිඳුකම අවම කිරීම අරමුණු කර ගනිමින් ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම, නව රැකියා උත්පාදනය/ ප්‍රවර්ධනය, අපනයන ප්‍රවර්ධනය වැනි හඳුනාගනු ලබන සංවර්ධන ක්ෂේත්‍රයන් තුළින් ග්‍රාමීය ආර්ථික පුනර්ජීවනය ඇති කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
e. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම/ සම්බන්ධීකරණය.

**6. ඉංජිනේරු අංශය**

a. දිස්ත්‍රික් ලේකම් කාර්යලායේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
b. වෙනත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල ඉදි කිරීම් ව්‍යාපෘති සඳහා උපදේශාත්මක සේවා සැපයීම
c. දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක ඉදිකිරීම් හා සේවා සැපයීමට අදාල ද්‍රව්‍ය, ශ්‍රමය හා සේවා සඳහා මිල නියම කිරීම.

**7.අභ්‍යන්තර විගණන අංශය**

a. වාර්ෂික විගණන සැලැස්ම පරිදි අභ්‍යන්තර විගණනය සිදුකර අනාවරණය කරගත් අඩුපාඩු හා නිර්දේශ සාකච්ඡා කිරීමේ යාන්ත්‍රණයක් ලෙස කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/01/2019 අනුව කාර්තුගත විගණන හා කළමනාකරණ දිස්ත්‍රික් කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීම හා ප්‍රාදේශීය කමිටු 4 බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි ම පැවැත්වීම
b. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි අභ්‍යන්තර විගණන කටයුතු හා අවශ්‍ය අවස්ථාවන්වල දී විමර්ශන සිදු කිරීම

**8. තොරතුරු තාක්ෂණ අංශය**

c. කාර්යය මණ්ඩලය සඳහා අන්තර්ජාල පහසුකම් හා විද්‍යුත් තැපැල පහසුකම් සැපයීම
d. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම හා සංවර්ධනය
e. අවශ්‍ය දත්ත පද්ධති හා මෘදුකාංග සංවර්ධනය සහ තොරතුරු තාක්ෂණ සේවා සැපයීම
f. පරිගණක නඩත්තුව හා කාර්යාලය තුල ජාල පද්ධතිය (Local Area Network) නඩත්තුව
g. කාර්යය මණ්ඩලයේ පරිගණක සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම

**9. ජාතික පොහොර ලේකම් කාර්යාලය - දිස්ත්‍රික් කාර්යාලය**

1988 අංක 68 දරණ පොහොර විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය ලෙස කටයුතු කරමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් පොහොර සම්බන්ධ කටයුතු නියාමනය කිරීම

**10. පුපුරණ ද්‍රව්‍ය අංශය**

1956 අංක 21 දරණ පුපුරණ ද්‍රව්‍ය ආරක්ෂණ පනතට අනුව ආරක්ෂක අමාත්‍යංශයේ අනුමතියට යටත්ව දිස්ත්‍රික් අවශ්‍යතාව සඳහා පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍ර හා බලපත්‍ර නිකුත් කිරීම

**11. ක්ෂේත්‍ර නිලධාරි අංශය**

අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු මගින් නියම කර ඇති හෝ ප්‍රතිපාදන වෙන් කිරීම් මත ක්ෂේත්‍ර නිලධාරීන් හරහා ක්‍රියාත්මක වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම හා ගෙවීම් කිරීමට සහායවීම.

<u>**සම්බන්ධීකරණ සේවා**</u>

1. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
3. ජාතික පොහොර ලේකම් කාර්යාලය
4. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් කාර්යාලය
5. දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය
6. ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය
7. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය - දිස්ත්‍රික් කාර්යාලය
8. මැතිවරණ දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් කාර්යාලය
9. ජාතික විගණන කාර්යාලය - දිස්ත්‍රික් කාර්යාලය
10. සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් කාර්යාලය
11. ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - දිස්ත්‍රික් කාර්යාලය
12. අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය
13. ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව - දිස්ත්‍රික් කාර්යාලය
14. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - දිස්ත්‍රික් කාර්යාලය
15. මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව (කිරුම් මිනුම් අංශය

## 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 ප්‍රගතිය සහ විශේෂ ළඟාකර ගැනීම්

**01.** Clean Sri Lanka වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය, රඹෑව, පදවිය හා කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් 2025.11.26 දින ජංගම සේවා හා සෞඛ්‍ය සේවා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. එමගින් ජනතාව මුහුණදෙන ජාතික හැඳුනුම්පත්, විශ්‍රාම වැටුප් හා වැඩිහිටි දීමනා, ඉඩම් සහ පළාත් පාලන ආයතනවලට අදාළ ගැටලු සඳහා විසඳුම් ලබාදීමත්, බෝ නොවන, මානසික, වකුගඩු, මාතෘ හා ළමා සහ අක්ෂි රෝග හඳුනාගැනීම හා අවශ්‍ය සෞඛ්‍ය දැනුවත් කිරීම සිදු විය.

එමෙන්ම 2025.12.10 දින අනුරාධපුර මහ නගර සභා සීමාව තුළ පාරිසරික අවබෝධය වර්ධනය කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම සහ ප්‍රජා සහයෝගය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් පාරිසරික මෙහෙයුමක් ක්‍රියාත්මක වන අතර, එදිනම කලාව හරහා ආචාරධර්මීය වටිනාකම් ප්‍රචලිත කිරීම සඳහා දිස්ත්‍රික් සාහිත්‍ය හා කලා මහෝත්සවයක්ද පැවැත්වීමද සිදු කරන ලදි. එමෙන්ම දිට්වා සුළි කුණාටුවෙන් විනාශයට පත්වූ පාසල් පුස්තකාල සඳහා අවශ්‍ය පොත් ලබාදීමට කටයුතු කරන ලදි. මේ සඳහා රුපියල් 4,647,875.00 ප්‍රතිපාදන වෙන්කරන ලද අතර වියදම 4,647,590.00 කි.

**02 . දිස්ත්‍රික් ක්‍රම සම්පාදන කාර්යාලය යටතේ පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.**

| අනු අංකය | ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ව්‍යාපෘති ගණන | වෙන්කළ ප්‍රතිපාදන | | වියදම | | ප්‍රගතිය % | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | රුපියල් | ශත | රුපියල් | ශත | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
| 1 | විමධ්‍යගත අයවැය වැඩසටහන - 2025 | 48933 | 73 | 102,990,000 | 00 | 89,562,014 | 47 | 86.96 | 93.2 |
| 2 | දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන - 2025 | 33701 | 112 | 73,000,000 | 00 | 66,006,427 | 90 | 90.42 | 96.4 |
| 3 | ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2025 | 38 | 2 | 7,651,625 | 00 | 6,062,746 | 85 | 79.23 | 90 |
| 4 | ප්‍රජාශක්ති වැඩසටහන - ඩිජිටල් උපකරණ මිලදී ගැනීම | ප්‍රා.ලේ. කාර්යාල 22 සහ දි.ලේ. කාර්යාලය | 23 | 27,811,454 | 40 | 27,811,454 | 40 | 100 | 100 |
| 5 | ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම ( පාසැල් හා මහජන ක්‍රීඩාංගන ) - 2025 | පාසැල් 9 | 9 | 15,752,882 | 96 | 14,655,471 | 43 | 93 | 100 |
| එකතුව | | | **219** | **227,205,962** | **36** | **204,098,115** | **05** | | |
| 6 | සංචාරක සංවර්ධන කටයුතු - 2025 | ප්‍රා.ලේ. කොට්ඨාශ 03 | 5 | 31,087,235 | 36 | 16,584,979 | 69 | | |
| 7 | ලෝක ආහාර වැඩසටහන - 2025 | 200 | 200 | 48,265,000 | 00 | 47,845,153 | 26 | 100 | 100 |

**03.** **අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ ගෙවීම් සඳහා සුදුසු තැනැත්තන් හඳුනාගැනීමේ වැඩසටහන**

පළමු අදියර

- මුළු අයදුම්පත් සංඛ්‍යාව **173,622** කි.
- දත්ත පරීක්ෂා කිරීමෙන් පසු, තෝරාගෙන ඇත අයදුම්පත් ගණන **160,857** ක්.

**2025.12.31** දිනට සුදුසුකම් ලැබූ මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව **53,302** ක් වේ.

- **අන්ත දිළිඳු (Severely Poor)** – 7,600
- **දිළිඳු (Poor)** – 26,093
- **අවදානම් (Vulnerable)** – 19,609

➢ අස්වැසුම වැඩසටහන සම්බන්ධයෙන් ඉදිරිපත් වූ

- **අභියාචනා සංඛ්‍යාව** – 47,661
- **විරෝධතා සංඛ්‍යාව** – 4,755

**දෙවන අදියර**

- ඉදිරිපත් වී ඇති මුළු අයදුම්පත් සංඛ්‍යාව **68,411** කි..
- දත්ත පරීක්ෂා කිරීමෙන් පසු තෝරාගෙන ඇති අයදුම්පත් ගණන., **41,941** ක්
- **2025.12.31** දිනට සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව **7,681** කි.

**04.** **දිස්ත්‍රික් ආපදා සහන සේවා කටයුතු**

| අනු අංක | ව්‍යාපෘතිය | ප්‍රතිලාභී සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන (රු) | වියදම (රු) | ප්‍රගතිය (%) මූල්‍ය | ප්‍රගතිය (%) භෞතික |
|---|---|---|---|---|---|---|
| 1 | සුරක්ෂිත මධ්‍යස්ථාන වැඩිදියුණු කිරිම | 30 | 15,289,330.00 | 15,289,330.00 | 100% | 100% |
| | **එකතුව** | | **15,289,330.00** | **15,289,330.00** | | |
| 2 | නැවත පදිංචි කිරීමේ වැඩසටහන | 1 | 900,000.00 | 900,000.00 | 100% | 100% |
| | **එකතුව** | | **900,000.00** | **900,000.00** | | |
| 3 | දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදු වූ ජීවිත හානි සඳහා වන්දි ගෙවීම් | 8 | | 6,500,000.00 | 78% | |
| | වෙනත් මරණ සඳහා වන්දි ලබාදීම | 7 | | 6,800,000.00 | | |
| 4 | දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පීඩාවට පත් පවුල් වල ළමුන් සඳහා පාසල් උපකරණ දීමනාව ගෙවීම | 4788 | | 71,820,000.00 | 77% | |
| 5 | දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පූර්ණ නිවාස හානි වූ පවුල් වෙත නිවාස කුළි දීමනාව ගෙවීම | 74 | | 1,850,000.00 | 99% | |
| 6 | පිසූ ආහාර,වියළි සලාක,කඩිනම් සහන සහ වෙනත් වියදම් | 15200 | 311,280,000.00 | 142,265,509.40 | | |
| | **එකතුව** | | **311,280,000.00** | **229,235,509.40** | | |
| 7 | අර්ධ නිවාස හානි වන්දි ගෙවීම | 641 | 123,211,264.45 | 25,359,655.71 | 25% | |
| 8 | දිට්වා සුළි කුණාටුව හේතුවෙන් හානියට පත් නිවාස පිරිසිදු කිරිම සඳහා රු.25000/- ගෙවීම | 13541 | 410,600,000.00 | 338,375,000.00 | 98% | |
| 9 | දිට්වා සුළි කුණාටුව හේතුවෙන් හානි වූ නිවාස වල ගෘහ උපකරණ යථාවත් කිරිම සඳහා රු.50000 /-ලබාදීම | 5383 | 408,000,000.00 | 269,100,000.00 | 92% | |
| | **එකතුව** | | **941,811,264.45** | **632,834,655.71** | | |
| | **මුළු එකතුව** | | **958,000,594.45** | **878,259,495.11** | | |

## 05. - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

- **මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක**

| අ.අ. | ව්‍යාපෘතිය | ප්‍රතිලාභී සංඛ්‍යාව | වෙන් කළ ප්‍රතිපාදන | | වියදම | | ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රුපියල් | ශත | රුපියල් | ශත | මූල්‍ය රුපියල් | ශත | භෞතික % |
| 1 | අස්වැසුම ප්‍රතිලාභීන් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන | 167 | 8350000 | -– | 8350000 | -– | | | 100 |
| 2 | සමෘද්ධි සහනාධාර ලැබූ පවුල් සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන | 143 | 11025000 | -– | 10545103 | 20 | | | 96 |
| 3 | ආදර්ශ නිෂ්පාදන ගම්මාන වැඩසටහන | 4 | 9797000 | -– | 9794620 | -– | | | 100 |
| 4 | වෘත්තීය පුහුණු වැඩසටහන | 104 | 9369000 | -– | 4781841 | -– | | | 51 |
| 5 | වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන | 196 | 1164000 | -– | 575226 | 98 | | | 49 |
| 6 | ව්‍යවසායකත්ව ධාරිතා සංවර්ධන වැඩසටහන | 33 | 1500000 | -– | 1478980 | -– | | | 100 |
| එකතුව | | 647 | 41205000 | -– | 35525771 | 18 | | | |

- **ජීවනෝපාය සංවර්ධන වැඩසටහන**

| අනු අංකය | ව්‍යාපෘතිය | ප්‍රතිලාභී සංඛ්‍යාව | වෙන්කළ ප්‍රතිපාදන | | වියදම | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | රුපියල් | ශත | රුපියල් | ශත | මූල්‍ය රුපියල් | භෞතික % |
| 1 | නොච්චියාගම සුව බොජුන්හල ඉදිකිරීම | 12 | 2250000 | 00 | 2220910 | 20 | 98.70 | 100 |
| 2 | මැදවච්චිය සුව බොජුන්හල ඉදිකිරීම | 12 | 4491148 | 25 | 4360004 | 75 | 97.07 | 100 |
| එකතුව | | 24 | 6741148 | 25 | 6580914 | 95 | 97.62 | 100 |

- **සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන**

| අනු අංකය | ව්‍යාපෘතිය | ප්‍රතිලාභී සංඛ්‍යාව | වෙන්කළ ප්‍රතිපාදන | වියදම | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | රුපියල් | රුපියල් | මූල්‍ය රුපියල් | භෞතික % |
| 1 | සිප්දොර ශිෂ්‍යත්ව 2023 - 2025 අධ්‍යාන වර්ෂය | 461 | 7,525,500.00 | 7,525,500.00 | 100 | 100 |
| 2 | සිප්දොර ශිෂ්‍යත්ව 2024 - 2026 අධ්‍යාන වර්ෂය | 593 | 15,282,000.00 | 15,282,000.00 | 100 | 100 |
| 3 | සිප්දොර ශිෂ්‍යත්ව 2025 - 2027 අධ්‍යාන වර්ෂය | 467 | 3,502,500.00 | 3,502,500.00 | 100 | 100 |
| එකතුව | | 1521 | 26,310,000.00 | 26,310,000.00 | 100 | 100 |

- **සමාජ සංවර්ධන වැඩසටහන්**

| අනු අංකය | ව්‍යාපෘතිය | ප්‍රතිලාභී සංඛ්‍යාව | වෙන්කළ ප්‍රතිපාදන | වියදම | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | රුපියල් | රුපියල් | මූල්‍ය රුපියල් | භෞතික % |
| 01 | කැකුළු ළමා ශිෂ්‍යත්ව පෙරහුරු වැඩසටහන් | 1897 | 260,920.00 | 260920.00 | 100% | 100% |
| 02 | මත් නිවාරණ හා ගෘහ කළමනාකරණසතුටු පවුල් වැඩ සටහන | 207 | 65,230.00 | 65230.00 | 100% | 100% |
| 03 | ජාත්‍යන්තර දින සැමරුම් වැඩසටහන් | 214 | 130,460.00 | 130460.00 | 100% | 100% |
| 04 | මනො සමාජ සවිබල ගැන්වීම් ( නිළධාරි පුහුණුව) | 474 | 506,550.00 | 506550.00 | 95% | 100% |
| 05 | මනෝ සමාජීය ප්‍රජා සවිබල ගැන්වීමේ වැඩ සටහන් | 2298 | 1,205,550.00 | 675918.00 | 80% | 80% |
| **එකතුව** | | **5090** | **2,168,710.00** | **1583562.00** | **70%** | **85%** |

**06.** 2025 වර්ෂයේ වන අලින්ගෙන් සිදු වූ ජීවිත හානි 41ක්, ශාරිරික හානි 62ක් හා දේපල හානි 1,223 ක් වාර්තා වි ඇති අතර 2025 වර්ෂයේ වන්දි කමිටුව මගින් අනුමත සමස්ථ වන්දි ගෙවීම් ජීවිත හානි 33 ක් සඳහා රු.30,000,000.00 ක් ද ශාරිරික හානි 47 ක් සඳහා රුපියල් 3,449,788.27 ක්ද දේපල හානි 1057 ක් සඳහා වන්දි රුපියල් 57,584,543.43 ක් ද ලෙස වූ මුළු ගෙවීම් ප්‍රමාණය රුපියල් 91,034,331,70.කි

**07.** 2025 වර්ෂයේ දී වගා /දේපල හා රාජ්‍ය ආරක්ෂණ ගිනිඅවි අලුත් කිරීම් 1687 ක් ද නව ගිනිඅවි අයදුම්පත් 44 ක්ද, පැවරීම් 12 කි. ගිනිඅවි අධිකාරිත්වය මාරුකිරීම් 03 ක් හා අබලන් ගිණිඅවි වෙනුවට නව ගිනිඅවි මාරුකිරීම් 09 ක් සිදුකර ඇත.

**08.** අනුරාධපුර දිස්ත්‍රික්කයේ **කෘෂිකාර්මික සංවර්ධනය යටතේ** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22ම ආවරණය වන පරිදි උදු හා මුං වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති අතර, ඒ සඳහා වෙන් කළ මුළු මුදල රුපියල් **මිලියන 1,258,729.00** ක් වන අතර, ප්‍රතිලාභීන් **252 දෙනෙකු** සඳහා වියදම් කළ මුළු මුදල රුපියල් **මිලියන 1,256,276.00** කි.

එමෙන්ම, වනසතුන්ගෙන් සිදුවන වගා හානි අවම කිරීම සඳහා වායු රයිෆල් ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති අතර, ඒ සඳහා වෙන් කළ මුදල රුපියල් **මිලියන 4,944,000.00** ක් වේ. ඉන් වියදම් කර ඇති මුදල රුපියල් **4,398,250.00** කි.

**09.** දිස්ත්‍රික්කයේ වැඩිහිටි කටයුතු සම්බන්ධයෙන්, වැඩිහිටියන්ගේ සුභසාධන හා ජීවන තත්ත්වය උසස් කිරීම අරමුණු කරගෙන විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, වැඩිහිටියන් 610 දෙනකු සඳහා සුව පහසුකම් සැපයීම වෙනුවෙන් රුපියල් 59,974,000.00 ක මුදලක් වැය කර ඇති අතර, ආරෝග්‍යා වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 59 දෙනකු සඳහා රුපියල් 1,475,000.00 ක් වෙන් කර ඇත.
තවද, වැඩිහිටි වන්දනා චාරිකා සඳහා ප්‍රතිලාභීන් 1,760 දෙනකුට රුපියල් 1,200,000.00 ක මුදලක් වැය කර ඇති අතර, ග්‍රාමීය වැඩිහිටි සමිති සවිබල ගැන්වීම සඳහා සමිති 24 ක් සඳහා රුපියල් 2,343,000.00 ක් වෙන් කර ඇත.
ස්වයං රැකියා උත්පාදනය සඳහා ආධාර ලබාදීම යටතේ ප්‍රතිලාභීන් 9 දෙනකුට රුපියල් 638,000.00 ක් ලබාදී ඇත. එමෙන්ම, වැඩිහිටි නිවාස හා දිවා සුරකුම් මධ්‍යස්ථාන 05ක් සඳහා ඉදිකිරීම්, අලුත්වැඩියා කිරීම හා අවශ්‍ය උපකරණ ලබාදීම සඳහා රුපියල් 4,500,000.00 ක් වෙන් කර ඇත.

"දිරියපියස" වැඩසටහන යටතේ රුපියල් 700,000.00 ක මුදලක් වෙන් කර ඇති අතර, එයට අමතරව ආධාරක උපකරණ (ඇස් කණ්නාඩි, ශ්‍රවන උපකරණ, අක්ෂි කාච) ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව 269 කි. වැඩිහිටි දීමනා වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 15,053 දෙනකු සඳහා රුපියල් 899,587,000.00 ක මුදලක් වෙන් කර ඇත. "සියවස් ප්‍රණාම" වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 5 දෙනකුට රුපියල් 385,000.00 ක් ලබාදී ඇත.

දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් ලෙස, විශ්‍රාම පූර්ව දැනුවත් කිරීමේ වැඩසටහන් 100 ක් සඳහා රුපියල් 115,000.00 ක් වැය කර ඇති අතර, වැඩිහිටි සත්කාරක සේවා පුහුණුව (35 දෙනකු) සඳහා රුපියල් 219,000.00 ක් වෙන් කර ඇත. වැඩිහිටි නිවාස සුහසාධන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 90 දෙනකු සඳහා වාර්ෂික චාරිකාව සඳහා රුපියල් 75,000.00 ක් වැය කර ඇත.

තවද, ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම සඳහා ප්‍රතිලාභීන් 197 දෙනකුට රුපියල් 135,000.00 ක් වැය කර ඇති අතර, වැඩිහිටියන් පිළිබඳව තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් 120 දෙනකුට රුපියල් 85,000.00 ක් වෙන් කර ඇත. "ළමා ලෝකයයි – වැඩිහිටි දිවියයි" වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 150 දෙනකු සඳහා රුපියල් 35,000.00 ක් වැය කර ඇත.

**10.** දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් 2025 වර්ෂයේ රජයේ නිල නිවාස අලුත් වැඩියා කටයුතු සිදුකිරීම ව්‍යාපෘති 33 ක් ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා වෙන්කළ ප්‍රතිපාදන රුපියල් 69.429.469.41 වෙන්කළ අතර වියදම රුපියල් 54254695.75කි.භෞතික ප්‍රගතිය 100% කි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ව්‍යාපෘති 04ක් වෙන් කළ ප්‍රතිපාදන රුපියල් 45,716,181.31 කි. එයින් ව්‍යාපෘති 03ක වැඩ අවසන් කර ඇති අතර මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය අළුත්වැඩියා කිරීම සඳහා වෙන්කළ ප්‍රතිපාදන රුපියල් 17,045,143.60 ක් වන අතර එහි මූල්‍ය ප්‍රගතිය රුපියල් 1696673.37 ක් වේ. භෞතික ප්‍රගතිය 20% කි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් 2025 වර්ෂයේ වෙනත් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු වල සිදු කළ ව්‍යාපෘති සංඛ්‍යාව 31ක් වන අතර ඒ සඳහා වෙන්කළ ප්‍රතිපාදන රුපියල් 147,081,983.00 කි.

**11.** ගර්භනි මව්වරුන් සඳහා රුපියල් 45,000.00ක පෝෂණීය දීමනාව ලබාදීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභි මව්වරුන් 7131 දෙනකු සඳහා රුපියල් 34,3561,207.16 වියදම් දැරීම හා පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වේල ලබාදීමේ වැඩසටහන යටතේ දරුවන් 9002 දෙනකු සඳහා රුපියල් 156,565,335.00 ක්ද ගුරු අභිමානි පෙර පාසල් ගුරුවරු සඳහා දීමනාවක් ලබාදීමේ ගුරුවරුන් 880 දෙනකු සඳහා රු.39,376,000.00 වියදම් දැරීම, මෙන්ම ගැබිනි මව්වරුන් සඳහා එක් වරක් ලබා දෙන රු.5000.00 ක පෝෂණීය දීමනාව ලබා දීමේ වැඩසටහන සඳහා වියදම රුපියල් 42,480,000.00 කි. එමෙන්ම මීට අමතරව විවිධ දැනුවත් කිරිමේ වැඩ සටහන් සඳහා ප්‍රතිලාභීන් 2266 ක් සඳහා වියදම 669468.00කි.

**12.** අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචාරක නිවාසය වෙන් කිරීම මගින් 2025 වර්ෂයට උපයා ඇති ආදායම රු.1,122,500.00 කි .

**13.** මනෝ-සමාජ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පාසල් සිසුන්, තරුණ ප්‍රතිලාභීන් 637 දෙනකු සඳහා වියදම රුපියල් 100,000.00 කි.

**14.**2025 වර්ෂය තුළ දිස්ත්‍රික් මට්ටමින් සංස්කෘතික, ආගමික, සාහිත්‍යමය හා සමාජ සංවර්ධන ව්‍යාපෘති 11ක් සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යාපෘති යටතේ දොළොස් මහේ පහන වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් 3,000ක් වෙනුවෙන් රු.575,000.00ක් වෙන් කර සම්පූර්ණයෙන්ම වියදම් කර ඇත රාජ්‍ය පොසොන් උත්සවයේ හේවිසි පූජාව සඳහා රු.100,000.00ක් වෙන් කර සම්පූර්ණයෙන් වියදම් කර ඇත. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සාහිත්‍ය උත්සවය සඳහා රු.810,000.00ක් වෙන් කර ඇත.

තවද කලාකරු සුවදම් වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 100ක් සඳහා රු.330,000.00ක් ද, කලායතන ආධාර යටතේ කලායතන 94ක් සඳහා රු.432,500.00ක් ද, අභභිග කලාකරු ආධාර යටතේ කලාකරුවන් 255ක් සඳහා රු.255,000.00ක් ද, කලාකරු වෛද්‍යාධාර වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 11ක් සඳහා
රු.350,000.00ක් ද වෙන් කර එම මුදල් සම්පූර්ණයෙන් වියදම් කර ඇත. කලාභූෂණ සම්මානලාභීන් තේරීම සඳහා ප්‍රතිලාභීන් 11ක් වෙනුවෙන් රු.10,000.00ක් වෙන් කර සම්පූර්ණයෙන්ම වියදම් කර ඇත.

ආන්තික පවුල්වල දරුවන් සමාජගත කිරීමේ වැඩසටහන යටතේ දරුවන් 80 දෙනෙකු සඳහා රු.565,000.00ක් වෙන් කර සම්පූර්ණයෙන් වියදම් කර ඇති අතර, සංස්කෘතික මධ්‍යස්ථානවලට භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රදේශයේ සියලුම ප්‍රතිලාභීන් අරමුණු කරගනිමින් රු.3,792,842.00ක් වෙන් කර එම මුදල සම්පූර්ණයෙන් වියදම් කර ඇත. එසේම සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ප්‍රදේශයේ සියලුම ප්‍රතිලාභීන් වෙනුවෙන් රු.6,350,894.00ක් වෙන් කර සම්පූර්ණයෙන්ම වියදම් කර ඇත.

මෙම සියලු ව්‍යාපෘති සඳහා වෙන් කළ මුදල් නිසි ලෙස වියදම් කර ඇති අතර, මූල්‍ය හා භෞතික ප්‍රගතිය සියයට 100ක් වන අතර, එමගින් දිස්ත්‍රික්කයේ සංස්කෘතික සංවර්ධනය සහ ප්‍රතිලාභීන්ගේ සමාජ–සංස්කෘතික සුබසාධනය ඉහළ නැංවීමට සාර්ථක දායකත්වයක් ලබා දී ඇත.

**15.** 2025 වර්ෂය සඳහා කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ව්‍යාපෘති පහක් මඟින් ප්‍රතිලාභීන් 3,077 දෙනෙකු ආවරණය කර ඇත. එම ව්‍යාපෘති සඳහා මුළු වශයෙන් රු.825,320.00 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, ඒ අතරින් රු. 800,645.00 ක මුදලක් වියදම් කර ඇත. එහි මූල්‍ය ප්‍රගතිය 95.36%ක් වේ. රැකියා අපේක්ෂිත තරුණ ප්‍රජාව සවිබලගැන්වීමේ වැඩසටහනෙන් ප්‍රතිලාභීන් 64 දෙනෙකු ආවරණය කර රු.50,100.00 ක් වියදම් කරමින් 83.50% මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත. අවිධිමත් අංශයේ ශ්‍රමිකයන් 287 දෙනෙකු සවිබලගැන්වීම සඳහා රු. 119,965.00 ක් වියදම් කර 99.97% මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

උසස් පෙළ සිසුන් 242 දෙනෙකුට වැඩලෝකයට පිවිසීමට අවශ්‍ය ප්‍රායෝගික අත්දැකීම් ලබාදීමේ වැඩසටහන සඳහා වෙන්කළ මුදල සම්පූර්ණයෙන්ම වියදම් කරමින් 100% මූල්‍ය හා භෞතික ප්‍රගතියක් ලබා ඇත. එමෙන්ම රැකියාපොළ වැඩසටහන මඟින් 2,222 දෙනෙකුට ප්‍රතිලාභ සැලසීම සඳහා රු. 314,560.00 ක් වියදම් කර 98.30% මූල්‍ය ප්‍රගතියක් ද, ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ තරුණ පිරිස දැනුවත් කිරීමේ වැඩසටහනෙන් 262 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දී රු. 178,700.00 ක් වියදම් කර 95.05% මූල්‍ය ප්‍රගතියක් ද ලබා ඇත. සියලු ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය 100%ක් ලෙස සම්පූර්ණ කර ඇත

**16.** අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22ක සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව හා අබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය මගින් සිදු කරන ලද අබාධ සහිත වූවන්ගේ ජාතික ආධුනික ක්‍රීඩා තරඟාවලිය, ප්‍රජා මූලික පුනරුත්තාපන වැඩසටහන හා අබාධිත තොරතුරු නව දත්ත පද්ධතියට දත්ත ඇතුලත් කිරීමේ පුහුණු වැඩසටහන යන ව්‍යාපෘතීන් සඳහා වෙන්කළ ප්‍රතිපාදන මුදල 1,244,6100.00 ක් වන අතර වියදම් වූ මුදල 1,154,878.00 ක් වන අතර භෞතික ප්‍රගතිය 100%කි.

**17.** පාරිභෝගික කටයුතු අධිකාරිය යටතේ 2025 වර්ෂයේ මුළු වැටලීම් සංඛ්‍යාව 1,110 ක්ද, දඩ මුදල් අයවීම රුපියල් 12,777,000.00 කි. එමෙන්ම පාරිබෝගික දැනුවත් කිරීම් අතර පාසල් සිසුන්, මහජනතාව හා ව්‍යාපාරිකයින් දැනුවත් කිරීම් වැඩසටහන් සිදුකර ඇත.

18. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් 2025 වර්ෂය තුල අනුරාධපුර දිස්ත්‍රික්කය ආවරණය කරගනිමින් ආපදා අවම කිරීම, පෙරසුදානම් වීම, යටිතල පහසුකම් සංවර්ධනය, දැනුවත් කිරීම හා පුහුණු කිරීම යන ක්ෂේත්‍ර කිහිපයකම ව්‍යාපෘති සහ වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.

එහිදී සියඹලා ඇළ–යාං ඔය පුළුල් කිරීම, ජලය බැස යාම සඳහා විධිමත් කාණු සකස් කිරීම වැනි යටිතල පහසුකම් ව්‍යාපෘති 100% ප්‍රගතියකින් නිම කර ඇති අතර, ගල්කන්ද පුරාණ විහාරස්ථානයේ පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ළිඳ පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය 50% ප්‍රගතියක් ලබා ඇත. මෙම ව්‍යාපෘති සඳහා රු. 4,677,458.37 ක ප්‍රතිපාදන වෙන් කර එයින් රු. 2,237,796.30 ක් වියදම් දරා ඇත.

තවද, පාසල් හා ග්‍රාමීය මට්ටමේ ආපදා පෙර සූදානම් වැඩසටහන්, මෝසම් වර්ෂාව සඳහා ප්‍රාදේශීය පෙර සූදානම් වැඩසටහන් සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලැස්ම යාවත්කාලීන කිරීම ඇතුළු වැඩසටහන් 100% සාර්ථකව නිම කර ඇති අතර, ඒ සඳහා රු. 162,400.00 ක මුදලක් වියදම් කර ඇත. දැනුවත් කිරීම හා පුහුණු කිරීම යටතේ රසායනික, ජීව විද්‍යාත්මක හා න්‍යෂ්ඨික උපද්‍රව අවදානම් අවම කිරීම, රෝහල් හා ආයතන ගිණි ආරක්ෂණ, ග්‍රාමීය කමිටු සහ පළාත් පාලන නියෝජිතයින් දැනුවත් කිරීම, ජීවිතාරක්ෂක හා

ප්‍රථමාධාර පුහුණු වැඩසටහන් ආදී වැඩසටහන් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර ඇති අතර, එම කටයුතු සඳහා රු. 299,300.00 ක ප්‍රතිපාදන වෙන් කර රු. 253,006.00 ක් වියදම් කර ඇත. සමස්ත වශයෙන් 2025 වර්ෂය තුළ ව්‍යාපෘති හා වැඩසටහන් හරහා විශාල ප්‍රතිලාභී ජනතාවක් ආවරණය කරමින් රු. 5,139,158.37 ක මුළු ප්‍රතිපාදන වෙන් කර එයින්

රු. 2,653,202.30 ක් කාර්යක්ෂමව යොදා ගනිමින් දිස්ත්‍රික් මට්ටමේ ආපදා කළමනාකරණය හා සංවර්ධන කටයුතු සාර්ථකව ඉටු කර ඇත.

**19.** 1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය ලෙස කටයුතු කරමින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් අදාල කටයුතු නියාමනය කිරීම

**20.** 2025 වර්ෂය තුළ සමථකරණය පිළිබඳ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් රාජ්‍ය නිලධාරින්, ස්වේච්ඡා සංවිධාන, මූල්‍ය ආයතන සහ ප්‍රජාව ඇතුළු ප්‍රතිලාභීන් 145 දෙනෙකු ඉලක්ක කරගෙන ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා රු. 58,000.00 ක ප්‍රතිපාදන වෙන්කර ඇත.

එම වර්ෂයේදී ප්‍රජා සමථ මණ්ඩල 22ක්, ඉඩම් සමථ මණ්ඩල 01ක් සහ මූල්‍ය සමථ මණ්ඩල 01ක් ලෙස සමස්ත සමථ මණ්ඩල 24ක් පිහිටුවා ඇත. ඉඩම් සමථ මණ්ඩලය වෙත ආරවුල් 100ක් ලැබී ඇති අතර එයින් ආරවුල් 78ක වැඩ අවසන් කරමින්, 42ක් නිරවුල් කර සහතික ලබාදී, 19ක් නිරවුල් නොකිරීමේ සහතික ලබාදී ඇති අතර, කිහිපයක් නොපැමිණීම හෝ ඉල්ලා අස්කරගැනීම හේතුවෙන් අවසන් කර ඇත.

තවද 2025 වර්ෂයේ ප්‍රජා සමථ මණ්ඩල වෙත අධිකරණය, ශ්‍රී ලංකා පොලිසිය, බැංකු හා මූල්‍ය ආයතන ඇතුළු විවිධ මූලාශ්‍රවලින් මුළු ආරවුල් 20,314ක් සාකච්ඡාවට ලක් කර ඇති අතර, එයින් 5,889ක් නිරවුල් කර, 2,072ක් නිරවුල් නොකිරීම් ලෙසත්, 9,829ක් නොපැමිණීම මත නිරවුල් නොකිරීම් ලෙසත් වාර්තා වී ඇත.

සමස්තයක් ලෙස 2025 වර්ෂය අවසානයේදී සාකච්ඡා කළ ආරවුල් 20,314කින් 18,350ක වැඩ සාර්ථකව අවසන් කර ඇත.

**21.** සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහාවූ සංචාරක ආකර්ශනයක් ඇති හා නොමැති ස්ථාන හඳුනාගැනීම හා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම මෙන්ම සංචාරක සේවා සපයන ආයතන හඳුනා ගැනීම හා එම ආයතන දත්ත පද්ධතියට ඇතුල් කිරීම හා පළාත් සංචාරක දෙපාර්තමේන්තුව එක්ව සංචාරක මාර්ගෝපදේශකයින් පුහුණු කිරීම හා බලපත්‍ර ලබාදීම හා සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායකින් සඳහා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම උදෙසා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

**22**. දිස්ත්‍රික් පුපුරණ ද්‍රව්‍ය අවශ්‍යතාව වෙනුවෙන් නිකුත් කර ඇති අවසර පත්‍ර ප්‍රමාණය 121 ක් වන අතර ආදායම රුපියල්400,000.00 හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර 11 ක් නිකුත් කර ඇති අතර ආදායම රුපියල් 98,300.00 කි .

**23.** දිස්ත්‍රික්කයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මගින් සමස්ත ව්‍යාපෘති ඒකක 05ක් යටතේ ක්‍රියාත්මක වූ අතර ව්‍යවසායකත්වය සංවර්ධන ඒකකය මගින් ප්‍රතිලාභීන් 54 සඳහා වෙන්කළ ප්‍රතිපාදන මුදල රුපියල් 1,347,872.00 ක් වන අතර වියදම රුපියල් 12,393,776.00 කි .

තාක්ෂණික හා නව්‍යකරණ ඒකකය යටතේ ප්‍රතිලාභීන් 1060ක් සඳහා වෙන්කළ ප්‍රතිපාදන මුදල රුපියල් 1,505,663 ක් වන අතර වියදම රුපියල් 1401804කි. අලෙවි සංවර්ධන ඒකකය යටතේ ප්‍රතිලාභීන් 1605ක් සඳහා වෙන්කළ ප්‍රතිපාදන මුදල රුපියල් 1,855,290.00ක් වන අතර වියදම රුපියල් 1,719,341.00 කි.

පර්යේෂණ හා සංවර්ධන ඒකකය යටතේ ප්‍රතිලාභීන් 395සඳහා වෙනකළ ප්‍රතිපාදන මුදල රුපියල් 274,708.30 ක් වන අතර වියදම රුපියල් 2,026,694.30 කි. මූල්‍ය හා සහය සේවා ඒකකය යටතේ ප්‍රතිලාභීන් 742ක් සඳහා වෙන්කල ප්‍රතිපාදන රුපියල් 295413 වන අතර වියදම රුපියල් 226410.50 ක් වන අතර ව්‍යාපාර උපදේශන ඒකකය යටතේ ප්‍රතිලාභීන් 341ක් සඳහා වෙන්කළ ප්‍රතිපාදන 36643.64ක් වන අතර වියදම රුපියල් 29765.00 කි .2025 වර්ෂයේ සමස්ත ව්‍යාපෘති යටතේ මුළු ප්‍රතිලාභීන් 4685ක් සඳහා වෙන්කළ ප්‍රතිපාදන 5315589.94ක් වන අතර වියදම රුපියල් 4819390.80ක් වන අතර භෞතික ප්‍රගතිය 91% කි.

**24.** ව්‍යවසායක සංවර්ධනය සඳහා දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 535 දෙනකු සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙන්කළ මුදල රුපියල් 392,835.00 කි .

**25.** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කාන්තාවන් ආර්ථික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති සමාලෝචනය සඳහා 2025 වර්ෂයේ ප්‍රතිලාභීන් 1321ක් සඳහා වෙන්කළ ප්‍රතිපාදන මුදල 7434440.00 කි. වියදම රුපියල් 7333757.43 කි.

**26.** 2025 වර්ෂය තුළ දිස්ත්‍රික් මට්ටමින් ළමා ආරක්ෂාව හා ළමා සුභසාධනය වර්ධනය කිරීම සඳහා විවිධ ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ඒ අතර ශිෂ්‍ය තානාපති වැඩසටහන්, පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම හා ශක්තිමත් කිරීම, රියදුරන් හා නවාතැන් පහසුකම් සපයන ආයතන සඳහා පුහුණු වැඩමුළු, ළමා ආරක්ෂාව පිළිබඳ නිළධාරීන් දැනුවත් කිරීම, විශ්ව ළමා දිනය හා සම්බන්ධ වැඩසටහන්, මනෝ–සමාජීය ප්‍රථමාධාර වැඩසටහන් පැවැත්වීම සහ වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය සකස් කිරීම වැනි කටයුතු ප්‍රමුඛ වේ.

මෙම ප්‍රධාන ව්‍යාපෘති හරහා පුද්ගලයින් **1,900** දෙනෙකුට ප්‍රතිලාභ ලැබී ඇති අතර, අනුමත මුදල රු. **2,344,555.85**ක් වූ අතර, වියදම් කර ඇත්තේ රු. **2,311,675.83**ක් වන අතර, සමස්ත ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 98.5% කි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ග්‍රාමීය ළමුන්ගේ සුරක්ෂිතතාව වර්ධනය කිරීමේ ප්‍රජා වැඩසටහන්, ලෝක ළමා දිනය පාදක කරගත් විශේෂ වැඩසටහන්, ප්‍රජා ළමා ආරක්ෂණ පර්යේෂණ සමුළු මත පදනම් වූ ක්‍රියාකාරකම්, ආර්ථික අපහසුතා ඇති ළමුන් සඳහා අධ්‍යාපන ආධාර, පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම හා සක්‍රිය කිරීම, සහ පාසල් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන් හි ප්‍රතිලාභීන් **4,749** දෙනෙකුට ප්‍රතිලාභ ලැබී ඇති .

**27. "අනුරාධපුර පුවත්" Facebook** පිටුව හා **"Rajarata News" YouTube** නාලිකාව අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම මගින් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සිදු වන රජයේ සංවර්ධන කටයුතු, මහජන සේවා, විශේෂ වැඩසටහන්, උත්සව, දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් සහ හදිසි තොරතුරු ජනතාව වෙත කාලෝචිතව හා නිවැරදිව ප්‍රචාරය කිරීමට කටයුතු කර ඇත.

මෙම මාධ්‍ය වේදිකා හරහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති, ජනතා සහභාගීත්වය ඇති වැඩසටහන්, සෞඛ්‍ය, කෘෂිකර්ම, අධ්‍යාපන, පරිසර හා සමාජ සංවර්ධන ක්ෂේත්‍රවල තොරතුරු සරල සහ ප්‍රවේශගත ආකාරයකින් ජනතාව වෙත ඉදිරිපත් කර ඇත.

එමෙන්ම, සමාජ මාධ්‍ය භාවිතය තුළින් ජනතාව හා රාජ්‍ය ආයතන අතර සන්නිවේදන පාලම ශක්තිමත් කරමින්, මහජන අවශ්‍යතා හා ප්‍රතිචාර ඉක්මනින් හඳුනා ගැනීම, විශ්වාසනීය තොරතුරු ප්‍රචාරය කිරීම සහ ව්‍යාජ පුවත් අවම කිරීම සඳහාද මෙම Facebook පිටුව හා YouTube නාලිකාව වැදගත් භූමිකාවක් ඉටු කර ඇත.

**28. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ**, නව බළලුවැව අල් මදීනා ජුම්මා පල්ලියේ වැසිකිළි අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රතිලාභීන් **100 දෙනෙකු** වෙනුවෙන් රුපියල් **400,000.00** ක ප්‍රතිපාදන මුදල වෙන් කර ඇති අතර, එම ව්‍යාපෘතියේ **ප්‍රගතිය සියයට 100** ක් ලෙස සම්පූර්ණ කර ඇත.

**29**. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ළමා හිංසනය, අපයෝජනය, නොසැලකිලිමත්භාවය හා අවදානම් තත්ත්වයන් හඳුනාගෙන අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරීම, අවදානමට ලක්වූ ළමුන් ආරක්ෂිත පරිසරයකට යොමු කිරීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය අධිකරණය, පොලීසිය, සෞඛ්‍ය හා අධ්‍යාපන අංශ සමඟ එක්ව කටයුතු කිරීම, ළමුන්ගේ මානසික, සමාජීය හා නෛතික සංවර්ධනයට සහාය වන වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම හා විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා මැදිහත්වීම් සැලසුම් කිරීම වැනි කටයුතු සඳහා පැවති විවිධ ව්‍යාපෘති හා ප්‍රගති සමාලෝචනය සඳහා ප්‍රතිලාභීන් 12944 ක් සඳහා වෙන්කල ප්‍රතිපාදන මුදල රුපියල් 4,583,000.00 කි. වියදම රුපියල් 4,434,995.00කි.

30. කාන්තා කාර්යංශයේ දිස්ත්‍රික් උපදේශනය යටතේ දැනුවත් කිරීම හා පුහුණු කටයුතු, කාන්තාවන් සඳහා නීති, සමාජ සේවා, සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් නායකත්ව, වෘත්තීය, ජීවන කුසලතා හා ස්වයං විශ්වාස වර්ධන පුහුණු වැඩසටහන් කාන්තා සහ පවුල් ගැටළු සම්බන්ධ උපදේශන හා මගපෙන්වීම සැපයීම ගෘහස්ථ ගැටළු, පවුල් ගැටුම්, මානසික පීඩනය හා ලිංගික/සමාජීය ගැටළු සම්බන්ධ උපදේශන සේවා සැපයීම අවශ්‍ය අවස්ථාවලදී විශේෂඥ උපදේශන සේවාවන් වෙත යොමු කිරීම. නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් හා පූර්ව විවාහ උපදේශන වැඩසටහන් වෙනුවෙන් ප්‍රතිලාභීන් 76 දෙනකු සඳහා වෙන්කළ ප්‍රතිපාදන මුදල රුපියල් 80,000.00 ක් වන අතර වියදම 100% කි.

31. අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා වර්ධන හා ආයතනික භාෂා සැලසුම් පහසුකරණය ලබාදීම, භාෂා ප්‍රතිපත්තිය රැකගෙන වගකීම ඇති සේවා ලබාදීමට ආයතන ක්‍රියාවලිය පහසු කිරීම රාජ්‍ය නිලධාරීන් හා පාසල් සිසුන් අතර භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ දැනුම් වර්ධනය කිරීම හා දෙවන භාෂාවේ වැදගත්කම පිළිබඳ අවබෝධය ලබාදීම මඟින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මගින් භාෂා අයිතින් සුරකීමට කටයුතු කිරීම පාසල් සිසුන් සඳහා අඛණ්ඩව භාෂා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම වැනි ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් 1100 ක් වෙනුවෙන් වෙන්කළ ප්‍රතිපාදන මුදල රුපියල් 770,950.00 කි.

32. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව යටතේ වාර්ෂික සැලසුමට අනුව දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණ හා සම්බන්ධ ව්‍යාපෘති 08ක් ක්‍රියාත්මක කර ඇත. ඒ සඳහා රු. 2,430,000.00 ක මුළු ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, 2025 වසර අවසානයේ රු. 2,385,968.00 ක මුදලක් වියදම් කර ඇත.

දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීමේ ව්‍යාපෘතිය 50%ක භෞතික ප්‍රගතියක් දක්වා ක්‍රියාත්මක වන අතර, තෝරාගත් උප ජලාධාර සඳහා භූමි පරිහරණ කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ ග්‍රාමීය හා ක්ෂුද්‍ර ජල පෝෂක සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම ව්‍යාපෘති 100%ක භෞතික හා මූල්‍ය ප්‍රගතියක් ලබා සාර්ථකව අවසන් කර ඇත.

පස හා ජල සංරක්ෂණය තුළින් ඌණ පරිහරණ කෘෂිකාර්මික බිම්වල ඵලදායිතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘති 04ක් ක්‍රියාත්මක කර ඇති අතර එමගින් ප්‍රතිලාභීන් 45 දෙනෙකුට සෘජු ප්‍රතිලාභ ලැබී ඇත. එසේම විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 16ක් පවත්වමින් ප්‍රතිලාභීන් 470 දෙනෙකුට දැනුවත් කිරීම සිදුකර ඇත.

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් සැලසුම් අනුව පැවැත්වූ අතර, ඉඩම් යෝග්‍යතා වාර්තා 41ක් නිකුත් කිරීමද 100%ක ප්‍රගතියකින් සිදුකර ඇත. සමස්ත වශයෙන්, වාර්තාකාලය තුළ ඉඩම් පරිහරණ සැලසුම්කරණය, සංරක්ෂණය සහ දැනුවත් කිරීම සම්බන්ධ සියලුම කාර්යයන් සාර්ථකව ඉටුකරමින් ඉලක්ක සපුරාගෙන ඇත.

ශීර්ෂය 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල වාර්තා කිරීමේ පදනම 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම

විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම් නොවන ලැබීම්

(අ) ACA – 7 අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය තුළ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් අත්තිකාරම් 'බී' ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම් යටතේ දැක්විය යුතු වටිනාකම රු.23,505,168 ක් වුවත්, භාණ්ඩාගාර අත්තිකාරම් පියවීමක් සඳහා ලැබී තිබුණු රු.1,800,000 ක්, අත්තිකාරම් 'බී' ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීමක් ලෙස ACA – 7 ආකෘතිය තුළ දක්වා තිබීම හේතුවෙන් එම වටිනාකම රු.25,305,168 ක් ලෙස රු.1,800,000 ක් වැඩිපුර දක්වා තිබුණි. භාණ්ඩාගාර අත්තිකාරම් පියවීම සඳහා ලැබී තිබුණු රු.1,800,000 ක මුදලක් ACA – 7 අග්‍රිම ගැලපුම් ප්‍රකාශන තුළ වෙනම හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2025 නොවැම්බර් 27 දිනැති භාණ්ඩාගාරයෙන් අග්‍රිම මුදල් මුදාහැරීම පිළිබඳ දැනුම්දීමේ නියෝගය අනුව සමාලෝචිත වර්ෂයේදී අග්‍රිම ගිණුම් අංක 7003/000/00/0105/00/0025/000 යටතේ රු.7,500,000ක අක්මුදල් විදේශාධාර ලෙස භාණ්ඩාගාර විසින් ලබාදී ඇතත්, එය ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර වලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්විය යුතු වුවත්, එම ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

### 1.6.2 අග්‍රිම ශේෂය

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ආයතනයේ පොත් අනුව අග්‍රිම ශේෂය, හා භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ශේෂය අතර රු.175,665,884 ක වෙනසට හේතු වූ කරුණු ACA – 3 ආකෘතිය තුළ හෙළිදරව් කර නොතිබුණි.

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේදී දේපළ පිරියත උපකරණවල ආරම්භක ශේෂයන් සඳහා එකතු කිරීම් යටතේ රු.33,573,370 ක් ද, අපහරණය කිරීම් යටතේ රු.1,402,758 ක් ද, ගැලපීම් කර තිබුණද, අදාළ ගැලපීම් තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

#### 3.1.1 වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතා

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණව නිවැරදිව පිළියෙල කළ යුතු වුවත්, වැය විෂයයන් 08 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35 සිට සියයට 100 දක්වා උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි.

### 3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අලිවැට ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂිත කුටි 06 ක් ඉදිකර තිබුණු අතර, පිරිවැය රු.1,200,000 ක් වූ කුටි 03 ක් අලිවැටක් නොමැති ස්ථානවල ඉදිකර තිබුණු බැවින් එම කුටිවලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

### 3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

## 3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 138 | සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් වවුචර් 83 ක් සඳහා සහතික කිරීමකින් තොරව රු.26,080,337 ක් ගෙවීම් කර තිබුණි. |
| (ආ) | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් සතු කැබ් රථ 03 ක ඉන්ධන දැවීම පිළිබඳ පරීක්ෂාව යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව පසුගිය වර්ෂ 02 ක කාලයක් තුළ සිදුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 භාණ්ඩ සහ වැඩ අත්පොතෙහි 6.6(ඇ) | කැකිරාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 23 ක දී සිදුකර තිබුණු රු.6,355,766 ක මිලදී ගැනීම් සම්බන්ධයෙන්, ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තා තබාගෙන නොතිබුණි. |

## 3.5 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

මුදල් රෙගුලාසි 371(5) අනුව අතුරු අග්‍රිම ශේෂ දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවද, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වන අලි ප්‍රහාරයකින් මියගිය අයකුගේ අවමංගල්‍ය කටයුතු සඳහා 2025 දෙසැම්බර් 19 දින ලබා දී තිබුණු රු.100,000 ක අතුරු අග්‍රිමය සමාලෝචිත වර්ෂය තුළ පියවා නොතිබුණි.

## 3.6 තැන්පතු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි පොදු තැන්පත් ගිණුම් 06 ට අදාළව 2025 දෙසැම්බර් 31 දිනට රු.193,068,135 ක ශේෂයක් පැවතුණි. එම ශේෂය තුළ පැවති තැන්පත් ගිණුම් 03 කට අදාළ රු.17,834,783 ක තැන්පතු, සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ 571 ප්‍රකාරව, කටයුතු නොකර වර්ෂ 02 කට වැඩි කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ පහළ මහල නවීකරණය කිරීමට අදාළව පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) පිරිවිතර වලට නොගැලපෙන වායුසමීකරණ යන්ත්‍ර 07 ක් සවිකර තිබියදී, පිරිවිතර වලට අනුව වායුසමීකරණ යන්ත්‍ර සවි කළ බවට සාවද්‍ය සහතික ලබාදීම මත බිල්පත් සකස් කර රු. 1,540,425 ක් ගෙවීම් සිදුකර තිබුණි.

(ii) කොන්ත්‍රාත් ගිවිසුමේ වැඩ විෂය අංක 02 යටතේ ඉටුකල යුතු කාර්යන්ට වඩා පාටිෂන් සඳහා පහළ කොටස ප්ලයිවුඩ් බෝඩ් සහ ඉහළ කොටස විදුරු සහිතව වැඩ නිම කිරීම වෙනුවෙන් නිවැරදි නොවන වැඩ විස්තරයක් දක්වමින් මිල කැඳවීම් සිදුකර සත්‍ය වශයෙන් ඇස්තමේන්තු කළ වැඩ විෂය ඉටුකර නොතිබිය දී කොන්ත්‍රාත්කරුට රු.141,231 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) මැදවච්චිය, තුලාවේල්ලිය උස්වාන වාරි මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජල මෝටර් 02 ක් හා ජල නල මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින රු.5,857,084 ක් චෙක්පත ලියා අතරදවාගෙන තිබුණු අතර, විගණිත දිනය වූ 2026 ජනවාරි 30 දින වන විට අදාළ භාණ්ඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සපයා නොතිබුණි. ව්‍යාපෘති භූමිය භෞතික පරීක්ෂාවේදී ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා කිසිදු මූලික කාර්යයක් සිදුකර නොතිබීම, ව්‍යාපෘතිය සඳහා විදුලිය සපයා ගැනීමට අපේක්ෂා කළ සූර්ය පැනල් පද්ධතිය විනාශ වී තිබීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අවිනිශ්චිත තත්ත්වයක් පැවතුණි.

4.2 ප්‍රසම්පාදනයන්

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් විසින් 2025 වර්ෂයට අදාළව මුදල් රෙගුලාසි 135 යටතේ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත සිදු කර තිබු මූල්‍ය බලතල පැවරීම අනුව රු.20,000 වඩා අඩු වටිනාකම් සහිත මිලදී ගැනීම් සඳහා පමණක් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවට යොමු නොකොට ප්‍රාදේශීය ලේකම්වරයාට බලයදීමේ හැකියාව පැවතියද, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 26 කදී, රු.20,000 ට වැඩි මිල ගණන් ප්‍රසම්පාදන කමිටුවකට යොමු කිරීමකින් තොරව එකතුව රු. 2,827,336 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 881(1) සහ 2022 මාර්තු 16 දිනැති අංක 04/2022 දරණ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක ඇප තැබිය යුතු තනතුරු දරණ නිලධාරීන් 21 දෙනෙකු ඇප තැන්පත් කර නොතිබුණි.

## 4.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අස්වැසුම විෂය භාරව කටයුතු කර තිබූ සංවර්ධන නිලධාරි විසින් මරණයට පත් වූ අස්වැසුම ප්‍රතිලාභියෙකුට හා වෙනත් ප්‍රතිලාභීන්ට හිමි රු.2,350,500 ක මුදලක් අයථා ලෙස පුද්ගලික පරිහරණය සඳහා ලබා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදුකර වාර්තාවක් ලබාදී තිබුණු නමුත්, අවසන් පරීක්ෂණයන් සිදුකර නොතිබුණු අතර, එම නිලධාරිණිය පදවිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ස්ථානමාරු කර යැවීම හැර වෙනත් විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට හා අයථා ලෙස පරිහරණය කළ රජයේ මුදල් නැවත අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

උක්ත අස්වැසුම මුදල් අවභාවිතය සම්බන්ධයෙන් සිදුකළ මූලික විමර්ශන වාර්තාවට අනුව, මුදල් අවභාවිතාව සිදුකළ නිලධාරිනිය සම්බන්ධයෙන් පමණක් මූලික පරීක්ෂණ පවත්වා තිබුණි. ආයතන සංග්‍රහයේ III කොටසේ XLVIII පරිච්ඡේදයේ 31:1:7 වගන්තිය අනුව රජයේ මුදල් සාවද්‍ය ලෙස හෝ අයථා ලෙස හෝ පරිහරණය කිරීම හෝ වෙනත් අයෙකුට එසේ කිරීමට ඉඩ සැලසීම වරදක්වේ. ඒ අනුව රජයේ මුදල් අයථා ලෙස පරිහරණය කිරීමට හැකිවන සේ අදාළ සංවර්ධන නිලධාරියා වෙත පද්ධති මුරපද ලබා දී තිබුණු හා අස්වැසුම විෂය කටයුතු අධික්ෂණය පැවරී ඇති, එහෙත් නිසි පරිදි අධීක්ෂණය සිදුකර නොමැති නිලධාරින් සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

## 4.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාළව නිකුත් කළ එසේම මාස හයකට වඩා කල් පමා වූ විගණන විමසුම් 04 ක් සඳහා 2026 මැයි 06 දින වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

## 4.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022/23 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩ සටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්/ආයතන 51 ක් සම්බන්ධ කර ගනිමින්, රු.1,130,094,432 ක් වැය කර, වියලි වී කිලෝග්‍රෑම් 5,749,900 ක්ද, තෙත වී කිලෝග්‍රෑම් 6,308,004 ක්ද, මිලදී ගෙන තිබුණු අතර, එම වී තොග භාවිතයෙන් අඩු ආදායම්ලාභී පවුල් වෙත සහල් කිලෝග්‍රෑම් 5,026,930 ක් නිෂ්පාදනයන් කර බෙදා හැර තිබුණි. ඉතිරි වී සහල් කර විවෘත වෙළඳපොලේ විකිණීමට තීරණය කර තිබුණු අතර, එහිදී රු.91,865,000 ක් වැය කර මිලදී ගෙන තිබුණු වී කිලෝග්‍රෑම් 918,650 කට අදාළ සහල් මෝල් හිමියන් 07 දෙනෙකු විසින් තෝරාගත් සැපයුම්කරුවන් වෙත සැපයීම පැහැර හැර තිබුණි. එම වටිනාකමින් 2025 දෙසැම්බර් 31 දින වන විට මෝල් හිමියන් 06 දෙනෙකු විසින් රු.3,592,000 ක් ගෙවීම් කර තිබුණු අතර, තවදුරටත් රු.91,865,000 ක මුදලක් ගෙවීම මෝල් හිමියන් විසින් පැහැර හැර තිබුණි.

(ආ) බලපත්‍රලාභීන් 112 දෙනෙකු වෙතින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් වෙත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කළුගල් කැණීම වෙනුවෙන්, රජයේ ගාස්තු වශයෙන් රු. 251,334,654 ක් අයවීමට පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට බලපත්‍රලාභීන් 90 දෙනෙකු වෙතින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් වෙත බොරළු කැණීම් මත අයවිය යුතු රජයේ ගාස්තු රු. 69,388,929 ක් අයවී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක දීර්ඝකාලීන බදු පදනම මත ලබාදී ඇති රජයේ ඉඩම් වලින් රු.48,162,895 ක් හිඟ බදු අයවීමට පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක ගැණුම් මිල මත ලබාදී ඇති රජයේ ඉඩම් වලින් රු.7,968,562 ක් හිඟ බදු අයවීමට පැවතුණි.

(ඊ) ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 04 කට අයත් ග්‍රාම නිලධාරී වසම් 79 ක අවසන් වරට ඉඩම් කච්චේරි පවත්වා සමාලෝචිත වර්ෂයේ අවසන් වන විට වසරකට අධික කාලයක් ගත වී තිබුණද, නියමානුකූල නොවූ ඉඩම් වෙනුවෙන් බලපත්‍ර ලබා ගැනීමට උනන්දුවන පිරිස් වලට ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඉඩම් කච්චේරි පැවැත්වීමට කටයුතු කර නොතිබුණු අතර, මේ හේතුවෙන් මෙම කාලසීමාව තුළ ඉහතින් සඳහන් වසම්වලින් ඉදිරිපත්ව තිබුණු ඉඩම් කච්චේරි පැවැත්වීමට අදාල මූලික ආකෘතිපත්‍ර 1523 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට නොහැකි වී තිබුණි.

(උ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක පුද්ගලයන් 19 දෙනෙකුට වැඩිපුර ගෙවා තිබුණු එකතුව රු.3,249,185 ක් වූ විශ්‍රාම වැටුප් මුදලින් තවදුරටත් රු.1,604,677 ක් අයවිය යුතුව පැවතුණි.

(ඌ) පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, 2024 වර්ෂයේ ජූලි හා අගෝස්තු මාසවල දී පළාත් ඉඩම් කොමසාරිස් විසින් අනුමැතිය ලබාදුන් ඉඩම් බලපත්‍ර 139 කින් බලපත්‍ර 94 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් නිකුත් කර නොතිබුණි.

(එ) මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොවි පන්තියේ පුද්ගලයන්ට බලපත්‍ර සකස් කිරීම සඳහා ග්‍රාම නිලධාරී වසම් 07 කට අදාලව පළාත් ඉඩම් කොමසාරිස් විසින් අවසන් තේරීම් ලැයිස්තු අනුමත කර, එවා තිබූ ඉ.කො.144(ඒ) ආකෘති පත්‍ර 11 ක ප්‍රමාණයක් සඳහා විගණිත දිනය වූ 2025 අගෝස්තු 26 දින වන විට වසර 01 ත් වසර 06 ත් අතර කාලයක් ගත වී තිබුණද, අදාල බලපත්‍ර සකස් කර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දීර්ඝ කාලීන බදු පදනමින් වානිජ කටයුතු සඳහා බදු දී තිබුණු ඉඩම් ගොනු 82 ක් අතරින් ගොනු 08 ක් සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2020/06(1) හා 2020 නොවැම්බර් 16 දිනැති චක්‍රලේඛයට පටහැනිව බදු සහන ගණනය කර බදු සහන ලබාදීම මත අහිමි වූ බදු ආදායම රු.71,472,514 ක් විය. 2025 ජූනි 11 දිනැති අංක 4/10/පොදු/බදු සහන(L2) දරන නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් අමතන ලද ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ලිපිය මගින් ඉහත කී 2026/06(1) චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව ඉඩම් කොටස් 08 ක් සඳහා ලබාදුන් බදු සහනය ඉවත් කර හිඟ බදු අයකර ගන්නා ලෙස දක්වා ඇතත්, හිඟ බදු අයකර ගැනීම හා එතැන් සිට විධිමත් පරිදි බදු අයකර ගැනීම 2026 අප්‍රේල් 30 දින වන විටත් සිදුකර නොතිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 අගෝස්තු 06 දිනැති අංක 01/2021 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛයේ උපදෙස් පරිදි ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තියේ 2.2.2 ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක අඛණ්ඩ සේවා කාලය වසර 05ත් 26ත් අතර වූ නිලධාරීන් 564 දෙනෙකු ස්ථාන මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක අනුමත හා සත්‍ය සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක සංවර්ධන නිලධාරීන් 80 ක් අතිරික්තව සිටියදී, පදවිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී 11 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සංවර්ධන නිලධාරීන්ට අනුයුක්ත කිරීමේදී සේවා අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

එම්.ජී.මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

**4.1** ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | **100%- 90%** | **75%-89%** | **50%- 74%** |
| **1.** දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කටයුතු ආරම්භකර ඇති ව්‍යාපෘ ප්‍රමාණය | ✓ | - | - |
| **2.** නිමවුම් වැඩ සිදු කෙරමින් පවතින ප්‍රමාණය | ✓ | - | - |
| **3.** ඉදිකිරීම් හි භෞතික වැඩ අවසන් කර ඇති ව්‍යාපෘති ප්‍රමා | ✓ | - | - |
| **4.** දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක වන වැඩසටහන් නියමිත කාලය තුළ සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කටයුතු සිදුකිරීම | √ | | |
| **5.** දිස්ත්‍රික්කය තුළ පරිසරය හා ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම සඳහා වන තීරණවලට එළඹීම සඳහා සියලු පාර්ශවයන් සමග සාකච්ඡා කිරීම, අවශ්‍ය තීරණ ක්‍රියාත්මක කිරීම | √ | | |
| **6.** අමාත්‍යංශ/දෙපාර්තමේන්තු මගින් දිස්ත්‍රික්කය තුළ සිදුකරන ව්‍යාපෘතීන් හා කාර්යයන් අධීක්ෂණය හා පසුවිපරම් කිරිම | √ | | |
| 7. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන හා මහජන සංවිධාන අධීක්ෂණය හා පහසුකම් සැපයීම | √ | | |
| 8. රජය මගින් ප්‍රමුඛ අවධානය ලබාදී ක්‍රියාකරන විශේෂ ව්‍යාපෘති දිස්ත්‍රික් මට්ටමින් සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීම | √ | | |
| **9. E-Government** සඳහා අවශ්‍ය වන පසුබිම සැකසීම | | √ | |
| **10.** දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධ සියලු රාජ්‍ය සේවකයින්ගේ ආයතන කටයුතු නිසි පරිදි සිදුවන බව තහවුරු කිරීම | √ | | |
| **11.** ප්‍රාදේශීය පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම | √ | | |
| **12.** දිස්ත්‍රික්කය තුළ සමාජ සුභසාධනය තහවුරු කිරීම | √ | | |
| **13.**දිස්ත්‍රික් කෘෂිකර්ම සැලැස්ම සැකසීම හා ක්‍රියාවට නැංවීම | √ | | |
| **14.**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින සියලු කාර්යය මණ්ඩලය නියමිත ආකාරයට පුහුණු කිරීම | | √ | |
| **15.**ඵලදායිතා සංකල්ප ප්‍රවර්ධනය හා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම | √ | | |

## 05. පරිච්ඡේදය

**තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය.**

**5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න**

| | ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50%- 74% | 75%- 100% |
| 01 | 2025 අයවැය ප්‍රතිපාදන යටතේ වැඩසටහන් 5ක් යටතේ ප්‍රාදේශීය සංවර්ධනය ඉහළ නැංවීම තුලින් ග්‍රාමීය ජනතාවගේ විවිධ පැතිකඩ ඔස්සේ ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම | දිස්ත්‍රික්කය සඳහා වෙන් වූ රුපියල් මිලියන 227.21 ප්‍රතිපාදන වලට අදාල සියළු ව්‍යාපෘති නියමිත පිරිවිතරයන්ට අනුව ඒ ඒ වැඩසටහනට අදාල නියමිත කාලයට පෙර අවසන් කිරීම | ව්‍යාපෘති 214ක් අවසන් කිරීම | - | - | √ |
| 02 | ග්‍රාමීය ප්‍රදේශ මූලික කරගත් සංචාරක ආකර්ෂණීයත්වයක් ඇති ස්ථාන වැඩි දියුණු කිරීම හා උපාය මාර්ගික පහසුකම් වැඩිදියුණු කිරීම තුලින් දෙස් විදෙස් සංචාරකයින් ආකර්ෂණය කරවා ගැනීම හා ඒ තුලින් ග්‍රාමීය ප්‍රජාවගේ ඍජු හා වක්‍ර රැකියා උත්පාදනය වීම හා ජීවන මට්ටම ඉහළ නැංවීම | ප්‍රා. ලේ. කො. 4ක රු.මි 31.09 ක ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 6ක් නියමිත පිරිවිතරයන්ට අනුව ඒ ඒ වැඩසටහනට අදාල නියමිත කාලයට පෙර අවසන් කිරීම | ව්‍යාපෘති 1ක් අවසන් කිරීම | - | √ | √ |
| 03 | දිස්ත්‍රික්කයේ පවතින දරිද්‍රතාවය හා දිළිඳුකම නිසා පහත වැටී ඇති ග්‍රාමීය ප්‍රාථමික පාසල් වල දරුවන්ගේ පෝෂණ මට්ටම වැඩි කිරීම හා දරුවන්ගේ දෛනික පාසල් පැමිණීමේ මට්ටම වැඩි කිරීම තුලින් දරුවන්ගේ අධ්‍යාපන මට්ටම වැඩි දියුණු කිරීම. | පාසල් සඳහා දිවා ආහාරය සපයනු ලබන ආහාර සැපයුම් කරුවන්ගේ පහසුකම් සංවර්ධනය කිරීම තුලින් අහාර වේලේ ගුණාත්මක භාවය හා පෝෂණ මට්ටම ඉහල නැංවීම.<br>දරුවන් පාසල් පැමිණීමේ ප්‍රතිශතය ඉහළ නැංවීම පාසල් දරුවන්ගේ මන්ද පෝෂණය පහළ නැංවීම | දිස්ත්‍රික්කයේ ප්‍රා. ලේ. කො. 22 ආවරණය වන පරිදි පාසල් දරුවන්ගේ දිවා ආහාර වේලේ ගුණාත්මකභාවය වැඩි කරවීම සඳහා ගෙවතු 200ක් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම | - | - | √ |

**5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න**

2025 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන අප්‍රේල් මාසයේදී ලැබීමත් පළාත් පාලන මැතිවරණය මැයි මාසයේ පැවැත්වීමත් යන කරුණු මත ව්‍යාපෘති ආරම්භ කිරීම ප්‍රමාද වීමත් හා නොවැම්බර් මාසයේ අවසාන කාල පරිච්ඡේදයේදී බලපෑ "දිට්වා " සුළි කුණාටුවේ බලපෑමෙන් වැඩසටහන් වලට අදාල භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඉලක්ක ගත ප්‍රගතිය අතර වෙනසට හේතු වී ඇති ඇති බව කාණගාටුවෙන් සඳහන් කරමි.

## 06. පරිච්ඡේදය

<u>මානව සම්පත් පැතිකඩ</u>

6.1 - සේවක සංඛ්‍යා කළමණාකරණය - 2025.12.31 දිනට

| | | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත) |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 15 | 12 | 3 |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 91 | 73 | 18 |
| තෘතියික | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 4 | 3 | 1 |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 50 | 38 | 12 |
| ද්වීතියික | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 89 | 111 | -22 |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2221 | 2151 | 70 |
| ප්‍රාථමික | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 30 | 27 | 3 |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 189 | 169 | 20 |

**6.2 . ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

1. රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PS/GT/2020 (III වෙළුම) හා 2022.01.03 දිනැති ලිපිය අනුව අතිරික්තව සේවයේ නියුතු සංවර්ධන නිලධාරින් අතිරික්ත සේ නොසළකා කටයුතු කරන ලෙස දන්වා ඇත. නමුත් ද්වීතියික මට්ටමේ අනෙකුත් නිලධාරීන්ගේ පුරප්පාඩු මෙම අතිරික්ත නිලධාරීන්ගෙන් පියවා ගැනීමට කටයුතු කරන ලදි.

**6.3** මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය | වැඩසටහනේ ස්වභාවය දේශීය/විදේශීය | | නිමැවුම /ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | |
| නවක ග්‍රාම නිලධාරී පුහුණුව | 12 | දින 15 | රු.136,090.00 | - | දේශිය | නවක ග්‍රාම නිලධාරීන්ට තම වෘත්තිය කටයුතු සිදුකර ගෙන යාමට ආරම්භක පුහුණුවක් ලබා දීම |
| ක.සේ.නි සේවාරම්භක පුහුණු වැඩසටහන | 19 | දින 05 | රු. 71,660.00 | - | දේශිය | නවක ක.සේ. නිලධාරීන්ට තම වෘත්තිය කටයුතු සිදුකර ගෙන යාමට ආරම්භක පුහුණුවක් ලබා දීම |
| රියදුරු පුහුණු වැඩසටහන | 50 | පැය 06 | රු. 45,290.00 | - | දේශිය | මූලික මාර්ග නීති හා කාර්මික දැනුම තුලින් ආචාරශීලි රියදුරෙකු බිහිකිරීම |
| ඉඩම් රාජකාරි පිළිබඳ පුහුණු වැඩසටහන | 140 | පැය 06 | රු. 61,800.00 | - | දේශිය | ඉඩම් රාජකාරි පිලිබඳ දැනුවත් කිරීම |
| කාර්යාල කාර්ය සහයක රාජකාරී පිළිබඳ මූලික පුහුණුව | 60 | පැය 06 | රු. 49,450.00 | - | දේශිය | කා.කා.ස. රාජකාරී පිළිබඳ මූලික පුහුණුවක් ලබා දීම |
| අභ්‍යන්තර විගණන පුහුණු වැඩසටහන | 31 | පැය 06 | රු. 35,300.00 | - | දේශිය | අභ්‍යන්තර පාලන ක්‍රමවේද ශක්තිමත් කිරීම |
| රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 75 | පැය 06 | රු. 58,650.00 | - | දේශිය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රතිපාදන දැනුවත් කිරීම |
| සහභාගිත්ව සැලසුම්කරණය | 45 | පැය 06 | රු. 32,350.00 | - | දේශිය | ග්‍රාමීය ගැටළු හඳුනා ගැනීම පිළිබඳ දැනුවත් කිරීම |
| බලතල පැවරීම හා සම්බන්ධ වගකීම හා කාර්යභාරය | 30 | පැය 06 | රු. 31,200.00 | - | දේශිය | ආයතනික අභ්‍යන්තර මූල්‍ය පාලනය පිලිබඳ දැනුවත් කිරීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන - I | 30 | පැය 04 | රු. 15,800.00 | - | දේශිය | නූතන තොරතුරු තාක්ෂණ සංකල්ප පිලිබඳ දැනුවත් කිරීම |
| තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන - II | 30 | පැය 04 | රු. 14,000.00 | - | දේශිය | නූතන තොරතුරු තාක්ෂණ සංකල්ප පිලිබඳ දැනුවත් කිරීම |
| මූලික විමර්ශණ පැවැත්වීම හා විමර්ශන වාර්තා සකස් කිරීම | 50 | පැය 06 | රු. 69,200.00 | - | දේශිය | මූලික විමර්ශණ පැවැත්වීම පිලිබඳ දැනුවත් කිරීම |
| පැමිණිල්ල මෙහෙයවීම | 50 | පැය 06 | රු. 66,205.00 | - | දේශිය | පැමිණිල්ල මෙහෙයවීම පිලිබඳ දැනුවත් කිරීම |
| භාණ්ඩ සමීක්ෂණ පුහුණු වැඩසටහන | 65 | පැය 03 | රු. 42,000.00 | - | දේශිය | භාණ්ඩ සමීක්ෂණ පිලිබඳ දැනුවත් කිරීම |
| PL කාණ්ඩයේ නිලධාරීන් සඳහා පවත්වන ලද දෙදින පුහුණු වැඩසටහන | 300 | පැය 12 | රු.309,075.00 | - | දේශිය | කාර්යක්ෂම කා.කා.සහයකවරුන් පිරිසක් බවට පත් කිරීම |

- මුදල් අමාත්‍යංශ ලේකම්ගේ චක්‍රලේඛ 01/2024 අනුව ඒ ඒ නිලධාරීන් විසින් සේවා ව්‍යවස්ථාවට අනුව සුදුසුකම් සපුරාලීම වෙනුවෙන් සම්පූර්ණ කල යුතු අනිවාර්ය පුහුණුවීම් සඳහා පමණක් පුහුණු අවස්ථා ලබා දිය යුතු බව දැන්වීම හේතුවෙන් ඉහත පුහුණු වැඩසටහන් වලට අමතරව පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති විය.

පුහුණුව තුලින් නිලධාරීන්ගේ ඵලදායිතාවය ඉහළ නැංවීම මඟින් අරමුණු සාක්ෂාත් කර ගැනීම. නිලධාරීන්ගේ **දැනුම, කුසලතා හා වෘත්තීය හැකියාවන්** වර්ධනය කිරීම අරමුණු කරගනිමින්, **සංවිධානාත්මක හා නවීන පුහුණු වැඩසටහන්** ක්‍රියාත්මක කිරීම තුළින් ඔවුන්ගේ **කාර්ය ඵලදායිතාවය, කාර්යසාධන ගුණාත්මකභාවය සහ වගකීම් දරන හැකියාව** ඉහළ නැංවීමට කටයුතු කරනු ලැබේ.

මෙම පුහුණුව මඟින් නිලධාරීන්ට **නව ප්‍රතිපත්ති, තාක්ෂණික නවීකරණ, කළමනාකරණ ක්‍රමෝපායන් සහ සේවා ප්‍රමිතීන්** පිළිබඳ අවබෝධය ලබා දෙන අතර, **කාර්ය සාධනයේ කාර්යක්ෂමතාවය, වේගවත් හා නිවැරදි තීරණ ගැනීම, කණ්ඩායම් ලෙස කටයුතු කිරීම සහ ජනතා සේවය කේන්ද්‍ර කරගත් ප්‍රවේශය** ශක්තිමත් කරයි.

ඒ අනුව, පුහුණුව තුළින් ලැබෙන **දැනුම හා කුසලතා ප්‍රායෝගික ලෙස කාර්යභාරයන්ට යොදා ගැනීම** මඟින් ආයතනික අරමුණු සාර්ථක ලෙස ඉටු කර ගැනීමටත්, **ජාතික සංවර්ධන ඉලක්ක හා රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ අරමුණු** සමඟ සමපාතව ප්‍රතිඵලදායි සේවාවක් ජනතාවට සැපයීමටත් හැකි වනු ඇත

## 07. පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය(අනු කූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි/පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA–N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම්සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | නැත | විගණන විමසුම් 6කට පිළිතුරු සැපයීමට වර්ෂය තුළ නොහැකි විය.ඊට හේතුව 03ක් වර්ෂ අවසානයේ ලද විගණන විමසුම් වන අතර 03ක් සඳහා පැවති අපදා තත්ත්වය හේතුවෙන් පිළිතුරු ලැබීමේදී සිදුවූ ප්‍රමාදය | ඉදිරියේදී නියමිත පරිදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| 6. | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | මසක් තුල පිළිතුරු ලැබීම් ප්‍රමාදවීම් ඇත. | දැනුවත් කර ඇත. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 7. | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | - | - |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාළ නොවේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අදාළ නොවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල නොවෙ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල නොවේ | 1.රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය ලේකම්ගේ අංක PS/GT/2020 (III වෙළුම) හා 2022.01.03 දිනැති ලිපිය අනුව අතිරික්තව සේවයේ නියුතු සංවර්ධන නිලධාරින් අතිරික්තසේ නොසලකා කටයුතු කරන ලෙස දන්වා ඇත. එනමුත් ද්විතියීක මට්ටමේ අනෙකුත් නිලධාරින්ගේ පුරප්පාඩු මෙම අතිරික්ත නිලධාරින්ගෙන් පියවා ගැණිමට කටයුතු කරන ලදි.<br>2. ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව පුරප්පාඩු සඳහා බඳවාගැනීම් කල් තැබීම | |

| | | | | |
|---|---|---|---|---|
| | | | හේතුවෙන් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට නොහැකි වීම. | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරතිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | නැත | රා.ප.ච 2/2018(1)මගින් කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරිම අවශ්‍ය නොවන බව දන්වා ඇත. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබීම. | අනුකූල වේ | | |